1 A

257858

07-7-

SRI LANKA

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1995 අංක 2 දරන
# මරණ ලියාපදිංචි කිරීමේ
# (තාවකාලික විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1995 ජනවාරි මස 05 වන දින]

---

1995 ජනවාරි මස 06 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: ශත 60 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

## 1995 අංක 2 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1995 ජනවාරි මස 05 වන දින]

එල්. ඩී.—ඕ. 90/93

**අතුරුදන් වී ඇති බවට වාර්තා කර ඇති තැනැත්තන්ගේ මරණ ලියාපදිංචි කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකාවේ ඇති වූ ත්‍රස්තවාදී සහ රාජ්‍ය විරෝධී ක්‍රියා හේතු කොටගෙන උද්ගත වූ මහජන කැළඹීම්වල දී නොයෙක් තැනැත්තන් මියගොස් ඇති හෙයින් සහ එවැනි මරණ (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කිරීමට බාධක වන ඇතැම් ප්‍රායෝගික දුෂ්කරතා ඇති හෙයින් ද :

එවැනි මරණ ලියාපදිංචි කිරීමට හැකි වන සේ විධිවිධාන සැලැස්වීමට දැන් අවශ්‍ය වී ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය සහ පනත ක්‍රියාත්මකව පවතින කාලය.*

**1.** මේ පනත 1995 අංක 2 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට වර්ෂ දෙකක කාලයක් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක ව පවතින්නේ ය.

*මරණ සහතික සඳහා ඉල්ලුම් කළ හැක්කේ කවුරුන් විසින් ද යන වග.*

**2.** යම් තැනැත්තකු අතුරුදන් වී ඇති බවට වාර්තා වන සහ ඔහු ජීවත්ව සිටියේ නම් ඔහු ගැන ස්වභාවයෙන් අසන්නට ලැබෙන්නේ යම් තැනැත්තන්ට ද ඒ තැනැත්තන්ට අවුරුදු එකකට වැඩි කාලයක් තුළ දී ඔහු ගැන අසන්නට ලැබී නැති හෙයින් ඔහු මියගොස් ඇතැයි අනුමාන කරන අවස්ථාවක, ඔහු මියගොස් ඇතැයි ඔහුගේ ළඟම ඥාතියකු තරයේ ම විශ්වාස කරන්නේ නම්, ඔහුගේ මරණය, (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කිරීම පිණිස සහ ඔහු සම්බන්ධයෙන් මරණ සහතිකයක් තමා වෙත නිකුත් කරවා ගැනීම පිණිස මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ඒ ළඟම ඥාතියා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

*ඉල්ලුම් කිරීමේ කාර්ය පටිපාටිය.*

**3.** යම් තැනැත්තකුගේ මරණය ලියාපදිංචි කිරීම පිණිස මේ නියෝග යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක් ම, ඒ තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි දිස්ත්‍රික්කයේ උප්පැන්න සහ මරණ පිළිබඳ දිස්ත්‍රික්ක රෙජිස්ට්‍රාර්වරයා වෙත කරනු ලැබිය යුතු අතර, ඒ ඉල්ලීම මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය මගින් කළ යුතු ය.

*අතිරේක කරුණු සැපයිය යුතු බව.*

**4.** මේ පනත යටතේ වූ සෑම ඉල්ලීමක් ම, මරණය ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරන්නේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා මියගොස් ඇති බව තමාට විශ්වාස කිරීමට ඇති හේතු සඳහන් කරන දිවුරුම් පත්‍රයක් මගින් එකී ඉල්ලුම්කරු විසින් තහවුරු කරනු ලැබිය යුතු අතර, මරණය ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරනුයේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා ජීවතුන් අතර

සිටිනු අවුරුද්දක් එකකට වැඩි කාලයක් තුළ තමා දැක නැති බව හෝ ඔහු ගැන අසා නැති බව ස්ථිර කරමින් ඒ තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ ග්‍රාම නිලධාරියෙන් ලබා ගත් වාර්තාවක් සහ ඒ ඉල්ලීම තහවුරු කරන වෙනත් යම් සාක්ෂි ද සමග ඒ ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**ඉල්ලුම්පත්‍රය ප්‍රදර්ශනය කර තැබීම.**

5. මේ පනත යටතේ ඉල්ලීමක් ලැබුණු විට, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඒ ඉල්ලීමේ පිටපතක් තමාගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ද මරණය ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි හෝ ඔහුගේ ස්ථිර පදිංචිය තිබුණු ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි තැනගේ කාර්යාලයේ ද සති දෙකක කාලයක් ප්‍රදර්ශනය කර තැබීමට සැලැස්විය යුතු ය.

**ලියාපදිංචි කිරීමට විරෝධය දැක්වීම.**

6. මේ පනත යටතේ වූ ඉල්ලීමක පිටපතක් පළමුවරට ප්‍රදර්ශනය කරන ලද දිනයේ සිට එක් මාසයක් ඇතුළත දී, ඒ ඉල්ලීමට අදාළ වන තැනැත්තාගේ මරණය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට ඇති විරෝධතා ඒ තැනැත්තා විසින් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියවිල්ලකින් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එසේ විරෝධය පෑමට හේතු දක්වමින් ඒ විරෝධය පාන්නා විසින් සහ වෙනත් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශ මගින් ඒ විරෝධතා තහවුරු කරනු ලැබිය යුතු ය.

**මරණය ලියාපදිංචි කිරීම.**

7. (1) ඉල්ලීමකට විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා ඉඩ දී ඇති එක් මාසයක කාලසීමාව අවසන් වූ පසු, ඒ ඉල්ලීම තහවුරු කිරීම පිණිස ඇති සාක්ෂි සහ යම් විරෝධතාවක් ඇතිනම් ඒ විරෝධතා ද ඒ විරෝධතා තහවුරු කිරීමට ඇති සාක්ෂි ද සමග ඒ ඉල්ලීම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකා බැලිය යුතු අතර, ඔහු විසින් අවශ්‍ය යයි සලකන යම් විමසීමකින් පසු, ඉල්ලීමෙහි සඳහන් කරුණු වල සත්‍යතාව පිළිබඳ තමා සෑහීමට පත්වන්නේ නම්, ඒ ඉල්ලීමට ඉඩ දිය යුතු ය. තවද ඉහත කී පරිදි වූ ඒ විමසීමේ දී ඔහුට නිසැකවම දැනගැනීමට හැකි වූ පරිදි, (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කිරීමට අවශ්‍යවන්නා වූ ඒ මරණය පිළිබඳ විස්තර සඳහන් කරමින් තමාගේ අත්සන යටතේ වූ සහතිකයක් ඒ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සහතිකය ලැබීමෙන් පසු, 8 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කරමින් යම් සහතිකයක් ඔහු විසින් අවලංගු කරනු ලබන අවස්ථාවක දී හැර, ඒ සහතිකයේ නිශ්චිතව සඳහන් කර ඇති විස්තර නිසි රෙජිස්ට්‍රාර්වරයා විසින් (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පවත්වාගෙන යන මරණ ලේඛනයෙහි ඇතුළත් කරන ලෙස, ඒ රෙජිස්ට්‍රාර්වරයා විධාන කරමින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නියමයක් කළ යුතු ය.

(3) (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ තමා විසින් පවත්වා ගෙන යනු ලබන මරණ ලේඛනයෙහි මරණයක් සම්බන්ධයෙන් වූ විස්තර ඇතුළත් කරන ලෙස විධාන කරමින් (2) වන උපවගන්තිය යටතේ වූ නියම යක් රෙජිස්ට්‍රාර්වරයකුට ලැබුණු විට, ඒ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ විස්තර ඒ ලේඛනයෙහි වහාම ඇතුළත් කොට ලේඛනයේ නිසි ස්ථානයෙහි තම අත්සන තැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ වූ සෑම ලිඛිත නියමයක් ම අදාළ ලියාපදිංචි කිරීමේ සටහනේ දෙවන පිටපතට ඇමිණිය යුතු අතර, එය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ කාර්යාලය භාරයේ තැබීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට යැවීම පිණිස ඒ දෙවන පිටපත ද සමග දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

**සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධ වූ හෝ සහතිකයක් නිකුත් කිරීමට විරුද්ධව අභියාචනය.**

8. 7 වන වගන්තිය යටතේ, තමාට සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් ඉල්ලුම්කරුවකු විසින් හෝ සහතිකයක් නිකුත් කිරීමට විරුද්ධව 6 වන වගන්තිය යටතේ තම විරෝධතා ඉදිරිපත් කර තිබිය දී එකී සහතිකය නිකුත් කිරීමට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා ගත් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, එකී ප්‍රතික්ෂේප කිරීම හෝ සහතිකය නිකුත් කිරීමට විරුද්ධව අභියාචනයක්, අවස්ථාවෝචිත පරිදි, එම ප්‍රතික්ෂේප කිරීම හෝ සහතිකය නිකුත් කිරීම දැන්වූ දින සිට මාසයක් ඇතුළත දී රෙජිස්ට්‍රාර්වරයාට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඉදිරිපත් කර ඇති කරුණු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සමාලෝචනය කිරීමෙන් පසු, අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය ස්ථිර කිරීම හෝ 7 වන වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරන ලෙස ඒ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විධාන කිරීම හෝ 7 වන වගන්තිය යටතේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් අවලංගු කිරීම හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

**මියගිය බවට ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු ජීවත්ව සිටින බව දැනගන්නට ලැබුණු විට අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය.**

9. (1) මේ පනත යටතේ කරන ලද ඉල්ලීමක් ප්‍රකාරව යම් මරණයක් ලියාපදිංචි කර තිබිය දී, මරණය ලියාපදිංචි කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා ජීවත්ව සිටින බව ඉන්පසුව කිසියම් වේලාවක යම් තැනැත්තකුට දැනගන්නට ලැබුණහොත්, ඔහු විසින් වහාම ඒ බව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය.

(2) ඒ තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ලැබුණු විට, ඔහු විසින් අදාළ පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධරයා වෙත ඒ තොරතුර දන්වා යැවිය යුතු අතර, ඒ නිලධරයා විසින් ඒ තොරතුරේ සත්‍යතාව විමර්ශනය කොට, තමා වෙත ඒ තොරතුරු දැනුම් දුන් දිනයේ සිට සති හතරක් ඇතුළත දී රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වාර්තාවක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ලැබුණු විට, අවශ්‍ය යයි ඔහු සලකන යම් විමසීමකින් පසුව, මරණය ලියාපදිංචි කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා ජීවත්ව සිටින බවට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සෑහීමට පත් වුවහොත් ඔහු විසින්, තත් කාරණයේ අවස්ථාගත කරුණු අනුව යෝග්‍ය වන පරිදි, (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 52 වන වගන්තිය යටතේ යම් පියවරක් ගැනීම හෝ යම් නියමයක් කිරීම හෝ යම් විධානයක් කිරීම කළ යුතු ය.

(4) මේ පනත යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන යම් විමසීමක්, එය ආරම්භ කිරීමෙන් පසු එක් මාසයක් ඇතුළත දී අවසන් කරනු ලැබිය යුතු අතර, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පවත්වනු ලබන විමසීමකට අදාළව ඒ පනත යටතේ විමසීමක කාර්ය සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

වැරදි.

**10.** (අ) මේ පනත යටතේ තමා විසින් කරන ලද ඉල්ලීමක දැනදැනම අසත්‍ය ප්‍රකාශයක් කරන්නා වූ හෝ මේ පනත යටතේ අසත්‍ය තොරතුරක් සපයන්නා වූ; හෝ

(ආ) මේ පනත යටතේ කරන ලද ඉල්ලීමක් ප්‍රකාර යම් තැනැත්තකුගේ මරණය ලියාපදිංචි කර තිබේද ඒ තැනැත්තා ජීවත්ව සිටින බව දැන ගෙන, ඒ තොරතුර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත සැපයීම පැහැර හරින්නා වූ; හෝ

(ඇ) (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ නිකුත් කරන ලද මරණ සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් වන තැනැත්තා ජීවත්ව සිටින බව දැන දැනම හෝ ඒ බව විශ්වාස කිරීමට හේතු තිබිය දී වංක සිතින් හෝ වංචනික ලෙස භාවිතා කරන්නා වූ

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු තුනකට නොඅඩු වූ ද අවුරුදු පහකට නොවැඩි වූ ද කාලයකට බන්ධනාගාරගත කිරීමෙන් ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**12.** මේ පනතෙහි—

"නිසි දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා", "නිසි රෙජිස්ට්‍රාර්වරයා සහ දිස්ත්‍රික්කය" යන යෙදුම්වල (110 වන අධිකාරය වන) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතෙහි ඒවාට පිළිවෙළින් දී ඇති අර්ථ ම ඇත්තේ ය;

"දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන් (110 වන අධිකාරය වන) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත් කර ඇති උප්පැන්න සහ මරණ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයෙක් අදහස් වේ;

"රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නෙන්, (110 වන අධිකාරය වන) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත් කරන ලද උප්පැන්න සහ මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා අදහස් වන අතර ඊට නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාද ඇතුළත් වේ.

උපලේඛනය [3 වන වගන්තිය]

අතුරුදන් වූ තැනැත්තකුගේ මරණය ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය.

1. අතුරුදන් වූ තැනැත්තාගේ සම්පූර්ණ නම :———.

2. ස්ත්‍රී පුරුෂ භාවය සහ ජාතිය :———.

3. වයස :———.

4. මරණය සිදු වූ දිනය :———.

5. අන්තිමට පදිංචිව සිටියේ යයි දන්නා ස්ථානයේ ලිපිනය :———.

6. ස්ථිර පදිංචිය ඇරූ ස්ථානය :———.

7. පදවිය හෝ වෘත්තිය :———.

8. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම සහ පදිංචි ස්ථානය :———.

9. අතුරුදන් වූ තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධතාව :———.

යට කී....... (මියගිය තැනැත්තාගේ නම)............. අවුරුද්ද කට වැඩි කාලයක් අතුරුදන්ව සිටින බවත්, එකී........... මිය ගොස් ඇති බව මා උදක්ම විශ්වාස කරන බවත්..............පදිංචි ..........නමැති මම මෙයින් ප්‍රකාශ කරමි.

එම නිසා (110 වන අධිකාරය වූ) උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඔහුගේ/ඇයගේ මරණය ලියාපදිංචි කරන ලෙස මම ඉල්ලා සිටිමි.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :